“නැණ සයුර” අධ්‍යාපනික වැඩසටහන - 2022

සරසවි පිවිසුම් අත්වැල

උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**13 ශ්‍රේණිය**

ලකුණු දීමේ පටිපාටිය

**ව්‍යාපාර අධ්‍යයනය I**

| | | | |
|---|---|---|---|
| 01 | (3) | 16 | (3) |
| 02 | (4) | 17 | (2) |
| 03 | (5) | 18 | (3) |
| 04 | (2) | 19 | (1) |
| 05 | (1) | 20 | (5) |
| 06 | (2) | 21 | (4) |
| 07 | (4) | 22 | (1) |
| 08 | (1) | 23 | (2) |
| 09 | (3) | 24 | (4) |
| 10 | (1) | 25 | (3) |
| 11 | (3) | 26 | (1) |
| 12 | (1) | 27 | (5) |
| 13 | (4) | 28 | (4) |
| 14 | (4) | 29 | (1) |
| 15 | (3) | 30 | (5) |

31. (අ) රාජ්‍ය ආදායම්, රාජ්‍ය වියදම්

(ආ) පළාත් පාලන ආයතන, පළාත් සභා

32. (අ) 1972 අංක 5 දරණ, සංවර්ධන දෙපාර්තමේන්තුව
(ආ) ඒකාබද්ධ වීම, අත්පත් කරගැනීම

33. (අ) ප්‍රමාණාත්මක, ගුණාත්මක
(ආ) අනුෂාංගික අලාභ, මාර්ගස්ථ මුදල්

34. (අ) විද්‍යුත් සන්නිවේදනය, සාම්ප්‍රදායික සන්නිවේදනය
(ආ) ප්‍රවාහන මූලිකාංග, සුලභතාවය

35. (අ) වේදිකා කුවිතාන්සිය / වාප්පුකාර කුවිතාන්සිය, ප්‍රභවස්ථාන සහතිකය
(ආ) පිලිපීනය, මැනිලා

36. (අ) අග්‍ර, අන්තර් පුද්ගල / මානව
(ආ) අධිකාරිය / බලතල, විශේෂඥ බලය

37. (අ) කාර්ය / ඇණවුමට, ප්‍රවාහ
(ආ) අඛණ්ඩව තොග වාර්තා කිරීමේ ක්‍රමය, JIT

38. (අ) විකුණුම් ප්‍රවර්ධනය, වෙළෙඳ සේවක
(ආ) ප්‍රචාරණය, මහජන සම්බන්ධතා

39. (අ) ප්‍රධාන පුවරුව, වොච් ලිස්ට් / Wach List
(ආ) අනුස්ථාපනය, ආධුනිකත්ව

40. (අ) පුළුල් ක්ෂේත්‍ර ජාල / WAN, නාගරික ක්ෂේත්‍ර ජාලය / MAN
(ආ) විකුණුම්, මෙහෙයුම්

41.
1. භාෂාමය ගැටලු අධික වීම
2. පවතින විද්‍යුත් සන්නිවේදන ජාල ප්‍රමාණවත් නොවීම
3. මෘදුකාංගවල සිදුවන සීඝ්‍ර වෙනස්වීම්
4. සුරක්ෂිතභාවය අතින් වැදගත්කම අඩුය
5. යම් යම් අන්තර්ජාතික නෛතික ගැටලු පැනවීම
6. අන්තර්ජාලය හා විද්‍යුත් වාණිජ්‍යය මෘදුකාංග සම්බන්ධීකරණය අපහසු වීම

42.
1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
2. සුරාබදු දෙපාර්තමේන්තුව
3. මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව
4. රේගු දෙපාර්තමේන්තුව
5. පළාත් පාලන ආයතන

43. 1. ඕනෑම අවස්ථාවක කොටස් පහසුවෙන් අලෙවි කරගත හැකි වීම
2. සමාගමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු නිරන්තරව දැනගත හැකි වීම
3. කොටස් මිල දෛනිකව ප්‍රකාශ කරන බැවින් ආයෝජනවලින් උපරිම ප්‍රාග්ධන ලාභ ලැබීමේ හැකියාව
4. ආයෝජකයන්ගේ ආයෝජන වඩා හොඳ පාලනයකට යටත් වීම
5. ඉපැයුම් සඳහා බදු සහන හිමි වීම

44. 1. කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාරගැනීම
2. විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම
3. කල්බදු පහසුකම් සැපයීම
4. සමාගම්වල කොටස් ආරක්ෂණ කටයුතු සිදු කිරීම
5. කළමනාකරණ උපදේශන සේවා සැපයීම
6. ඒකකභාර කළමනාකරණය කිරීම

45. 1. ආයෝජන කටයුතු සඳහා සාමාජික රටවලට දිගුකාලීන ණය සැපයීම
2. ආධාර කණ්ඩායම් සංවිධානය කිරීම
3. ආධාර උපදේශක කණ්ඩායම් සංවිධානය කිරීම
4. පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතන සඳහා ණය සැපයීම
5. ප්‍රාග්ධන වෙළෙඳපොල දියුණු කිරීමට සහාය වීම
6. රජයන්ට උපදේශන සේවාවන් හා ආයතනික ආධාර සැපයීම
7. තාක්ෂණික හා විශේෂඥ ආධාර සැපයීම

46. 1. නිශ්චිත වීම / සුවිශේෂී වීම 2. මැනිය හැකි වීම
3. ළඟා කර ගත හැකි බව 4. යථාර්තවාදී බව
5. නිශ්චිත කාල සීමාවක් දක්වා තිබීම

47. 1. ඉහළ තත්ත්වයෙන් යුත් අමුද්‍රව්‍ය යොදා ගැනීම.
2. අපතය හා නාස්තිය අවම කර ගැනීම.
3. ප්‍රශස්ත ආකාරයෙන් ද්‍රව්‍ය තොග පවත්වා ගෙන යාම.
4. ද්‍රව්‍ය නැවත නැවත භාවිතයට ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය.
5. දියුණු තාක්ෂණය යොදාගැනීම තුළින්

48. 1. දැනුම් දීම 2. පෙළඹවීම
3. දිරිගැන්වීම 4. සිහිගැන්වීම

49. 1. ස්ථිරාංග 2. ජීවාංග
3. දත්ත 4. ක්‍රියාපටිපාටි

50. 1. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය
2. ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය
3. ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය
4. ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
5. ණය ආපසු ගෙවීමේ සටහන

# ව්‍යාපාර අධ්‍යයනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) (අ) භාණ්ඩ - ඇඳුම්
සේවා - රෙදි / ඇඳුම් මැසීම, අලෙවි කිරීම / විකිණීම (කරුණු 02 ලකුණු 01)
(උදාහරණ 02 ලකුණු 01)

(ආ) ශ්‍රමය - පුහුණු සේවිකාවන්
ප්‍රාග්ධනය - නව තාක්ෂණයෙන් යුත් මහන මැෂින්
ව්‍යවසායකත්වය - කාශ්‍යාගේ නිර්මාණශීලිත්වය
දැනුම - සේවක කුසලතා / දැනුම, අයිතිකරුගේ කුසලතා / දැනුම
කාලය - සේවකයින් සේවයේ යොදවන කාලය, මැෂින් (යන්ත්‍ර) සේවයේ යොදවා ගන්නා කාලය
තොරතුරු - නව තාක්ෂණය පිළිබඳ තොරතුරු, වෙළෙඳපොල පිළිබඳ තොරතුරු

(සම්පත් 02 ලකුණු 01)
(උදාහරණ 02 ලකුණු 01)

(ii) (අ) අයිතිකරු / කළමනාකරු - කාශ්‍යා
සේවකයින්
ගනුදෙනුකරුවන්
සැපයුම්කරුවන්
රජය (ලකුණු 1/2 × 4 = 02)

(ආ) ★ කාශ්‍යා ඇඳුම් මැසීමේ පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම
★ පුහුණු සේවකයන් සිටීම
★ ව්‍යාපාරයේ කීර්තිනාමය
★ ප්‍රමාණවත් ප්‍රාග්ධනය
★ නවීන තාක්ෂණයෙන් යුත් රෙදි මහන මැෂින් (ලකුණු 1 × 2 = 02)

(iii) <u>අවස්ථා</u>

★ ඇඳුම් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වීම
★ නවීන විලාසිතාවලට ඇති ඉල්ලුම වර්ධනය වීම (ලකුණු 1 × 2 = 02)

<u>තර්ජන</u>

★ විලාසිතා / මෝස්තර නිතර නිතර වෙනස්වීම
★ රෙදි (අමුද්‍රව්‍ය) මිල ඉහළ යාම
★ නව තරඟකරුවන් බිහිවීම (ලකුණු 1 × 2 = 02)

(iv) (අ) ★ රැකියා නියුක්තියට දායක වීම
★ මිනිස් වුවමනා සපුරාලීම
★ දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම (ලකුණු 1 × 2 = 02)

(ආ) ★ ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා
★ අසීමිත වගකීම
★ නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
★ අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
★ අලාභ තනිව භුක්ති විඳීමට සිදු වීම
★ අයිතිකරුගේ තනි තීරණ අසාර්ථක විය හැකි වීම (ලකුණු 1/2 × 4 = 02)

(v) වාසි
★ වෙළෙඳපොල පුළුල් වීම
★ තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම
★ කාලය ඉතිරි වීම
★ පිරිවැය අවම වීම
★ අඩු සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වීම (ලකුණු 1 × 2 = 02)

අවාසි
★ ගෙවීම් ක්‍රමවල ගැටළු ඇති වීම
★ පාරිභෝගික විශ්වාසය අඩු වීම
★ ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇති වීම
★ තාක්ෂණික බාධා ඇති වීම
★ නෛතික ගැටලු ඇති වීම (ලකුණු 1 × 2 = 02)

02. (i) (අ) 1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය
2. පූර්ණ සේවා නියුක්තියක් බිහිවීම
3. ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම
4. සාධාරණ ආදායම් ව්‍යාප්තියක් බිහි කිරීම
5. යහපත් අන්තර්ජාතික වෙළෙඳාමක් පවත්වාගෙන යාම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. බදු ගෙවීම
ව්‍යාපාර විසින් රජයට ගෙවිය යුතු බද්ද පැහැර හැරීමකින් තොරව ගෙවීමයි.
2. දේශීය සම්පත් භාවිතා කරයි.
ව්‍යාපාර දේශීය සම්පත් භාවිතා කිරීම නිසා විදේශවලට මුදල් ඇදී යාම වැළකේ.
3. නීතිරීති පිළිපැදීම
රජය ව්‍යාපාර සඳහා පනවන නීතිරීතිවලට අනුව කටයුතු කිරීමයි.
4. සේවා නියුක්තියට දායක වීම
ව්‍යාපාර තම කටයුතු සඳහා සේවකයන් බඳවාගැනීම මෙමඟින් දැක්වේ.
5. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිපැදීම
රජය විසින් පනවන පිස්කල් ප්‍රතිපත්තිය හා මූල්‍ය ප්‍රතිපත්තියට අනුව කටයුතු කිරීමයි.
6. පරිසරයට වන හානිය අවම කිරීම
ව්‍යාපාර පරිසරය හානිය අවම වන පරිදි හරිත නිෂ්පාදනයට යොමු වෙමින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමයි.

(ලකුණු 1 × 2 = 02)

(ii) (අ) 1. ආදායම් ඉපැයීම
2. ආදායම් විෂමතාවය අඩු කිරීම
3. සම්පත් බෙදාහැරීමේ දිශාව වෙනස් කිරීම
4. ආර්ථික ස්ථායිකරණය ඇති කිරීම
5. දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම
6. ඇතැම් භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කිරීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම
2. වෙළෙඳපොල විෂමාචාරවලින් ආරක්ෂා වීම
3. ගුණාත්මක භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව ලැබීම හා සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු වීම
4. අවශ්‍ය අවස්ථාවලදී නීතිමය රැකවරණ ලබාගත හැකි වීම
5. පාරිභෝගිකයාට ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම
6. පාරිභෝගික අධ්‍යාපනය ඉහළ යාම (ලකුණු 1/2 × 4 = 02)

(iii) (අ) 1. නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳ ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම
2. කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර සේවා පිහිටුවාගෙන යාම
3. දේශීය නිෂ්පාදිත මෙන්ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම
4. ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම
5. ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ඇති කිරීම

(ලකුණු 1 × 2 = 02)

(ආ) 1. අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය සහ එය ලබාගැනීමට ඇති ඉඩකඩ
2. වගකීම සීමිත ද අසීමිත ද
3. නෛතික පුද්ගලභාවයක් අවශ්‍ය ද නැද්ද
4. ව්‍යාපාරයේ පැවැත්ම කෙටිකාලීන ද දිගුකාලීන ද
5. අයිතිකරුවන් සංඛ්‍යාව
6. රජයෙන් ලබාදෙන විවිධ සහනාධාර (ලකුණු 1/2 × 4 = 02)

(iv) (අ)

| | නීති මූලාශ්‍රය | අදාළත්වය |
|---|---|---|
| 1 | 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත | හවුලක ස්වභාවය, හවුල් ඔප්පුව, ගිවිසුමක් නොමැති විට විසුරුවා හැරීම |
| 2 | 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත | ආයෝජිත ප්‍රාග්ධනය රු. 1 000 ට වැඩි නම් ලිඛිත ගිවිසුමක් අනිවාර්ය කිරීම |
| 3 | 2007 අංක 07 දරණ සමාගම් පනත | හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම හවුල්කරුවන් ගණන තීරණය කිරීම |
| 4 | 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත | ව්‍යාජ නාමයකින් පවත්වාගෙන යන ව්‍යාපාර ලියාපදිංචි කිරීම |

(ලකුණු 1 × 2 = 02)

(ආ)

| | නිර්නායකය | සීමිත පෞද්ගලික සමාගම් | සීමාසහිත පොදු සමාගම් |
|---|---|---|---|
| අ. | සාමාජික සංඛ්‍යාව | අවමය 01 උපරිමය 50 | අවමය 01 උපරිමය සීමාවක් නැත. |
| ආ. | ප්‍රාග්ධන සම්පාදනය | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ ණයකර නිකුත් කළ නොහැක. | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ ණයකර නිකුත් කළ හැක. |
| ඉ. | කොටස් පැවරීම | කොටස් පැවරීම නිදහසේ කළ නොහැක. | කොටස් පැවරීම නිදහසේ කළ හැක. |
| ඊ. | කොටස් වෙළෙඳපොල ලැයිස්තුගත වීම | කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත විය නොහැක. | කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත විය හැක. |

(ලකුණු 1/2 × 4 = 02)

(v) (අ) 1. කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම
2. අවම සාමාජිකයන් දෙදෙනෙකු වීම හා උපරිමය සීමා නොවීම
3. සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම
4. පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම
5. සමාගමේ ලාභ බෙදාහැරීමක් නොකිරීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) වාසි
- ★ රැකියා බිහි කිරීම
- ★ නවීන තාක්ෂණය හඳුන්වා දීම
- ★ උපකාරක සේවාවන් රට තුළ දියුණු වීම
- ★ විදේශ ආයෝජන මෙරටට ගලා ඒම
- ★ රජයට බදු ආදායමක් ලැබීම
- ★ සේවකයන්ට නව කුසලතා ලබාදීමට පුහුණු කිරීම (ලකුණු 1/2 × 2 = 01)

අවාසි
- ★ උපයන ලාභ මව්රටට ගෙන යාම
- ★ කාර්මික සබඳතා පිළිබඳ ගැටලු මතු වීම
- ★ දේශීය කර්මාන්ත කෙරෙහි අහිතකර ලෙස බලපෑම
- ★ රාජ්‍ය පාලනයට බලපෑම් ඇති කිරීම
- ★ කෙටි දැනුම්දීමකින් ඉවත්ව යා හැකි නිසා සේවා නියුක්තිය අහිමි වීම

(ලකුණු 1/2 × 2 = 01)

03. (i) (අ)
- ★ පුද්ගල හැකියාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩප්‍රස්ථාව ලැබීම
- ★ ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි වීම
- ★ කීර්තිනාමය ඉහළ යාම
- ★ ආත්ම තෘප්තිය ඉහළ යාම
- ★ ඉහළ ජීවන මට්ටමක් ලබාගත හැකි වීම
- ★ මූල්‍යමය ලාභ ලැබීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) ★ නිවසේ කටයුතු සඳහා වැඩි කාලයක් කැපකළ යුතු වීම
★ පුරුෂාධිපත්‍ය සංකල්පය මුල් ගැසෙමින් තිබීම
★ රජයේ දිරිගැන්වීම් මදකම
★ පහසුකම් සපයන ආයතන තුළ කාන්තාවන්ට ඇති අඩු පිළිගැනීම
★ ඇතැම් රටවල නීතිරීති මඟින් ඇති කරන පීඩනය (ලකුණු 1/2 × 4 = 02)

(ii) (අ) ★ දේශීය සම්පත් භාවිතා කිරීම
★ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම
★ ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම
★ නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම
★ වැඩි රැකියා ප්‍රමාණයක් සැපයීම
★ ආර්ථිකයේ අංශ අතර සමබර වර්ධනයක් ඇති කිරීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) ★ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ඇරඹීම අවදානම් සහගත වුවත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එම අවදානම අවම කරගත හැකිය.
★ ව්‍යවසායකයා සතු කැපවීම හා උනන්දුව මඟින් සුළු පරිමාණ ව්‍යාපාර සාර්ථකත්වයට පත් කරගත හැක.
★ ව්‍යවසායකයා තුළ පවතින ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපායි.

(ලකුණු 1 × 2 = 02)

(iii) (අ)

| ව්‍යාපෘතිය | මූල්‍ය අනුග්‍රහකත්වය ලබාදීම | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය |
|---|---|---|
| සුවන | අන්තර්ජාතික සහයෝගතාවය සඳහා වූ ජපාන ගිවිසුම | ජාතික සංවර්ධන බැංකුව |
| සහන්යා | ආසියානු සංවර්ධන බැංකුව | DFCC බැංකුව / අනෙකුත් වාණිජ බැංකු |

(ලකුණු 1/2 × 4 = 02)

(ආ) මුදලකින් ඉටු කරනු ලබන කාර්ය ඉටු කිරීමට ව්‍යාපාරය භාවිතා කරනු ලබන භෞතික නොවන මුදල් ගම්‍ය මුදල් වන අතර වටිනාකමේ සන්නිධියක කාර්යය ඉටුකරන මුදල් ආසන්න මුදල් වේ. ගම්‍ය මුදල් තුළ ආසන්න මුදල් ද ඇතුළත් වේ.

(නිවැරදි පිළිතුරට ලකුණු 02)

(iv) (අ) ★ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
★ ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර
★ චෙක්පත් තැන්පතු යන්ත්‍ර
★ වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල
★ ටෙලි බැංකු පහසුකම්
★ අන්තර් ජාල බැංකු කටයුතු (ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. එතැන් පරීක්ෂණය - වාණිජ බැංකුවල පොත්පත් මහ බැංකුව වෙත ගෙන්වාගෙන පරීක්ෂා කිරීම

2. දුරස්ථ අධීක්ෂණය - මහ බැංකු නිලධාරීන් වාණිජ බැංකු වෙත ගොස් පරීක්ෂා කිරීම

(ලකුණු 1 × 2 = 02)

(v) (අ) ★ ඒකක විකිණීමෙන් රැස් කරගන්නා මුදල් සංචිතයක් වීම
★ ඒකකයක නාමික අගය රු. 10 ක් වීම
★ ඒකකවලට ද්විතීයික වෙළෙඳපොලක් නොමැති වීම
★ මුදල් සංචිතය ආයෝජන කළඹක ආයෝජනය කිරීම
★ ඒකක නැවත ඒකක භාරය වෙත අලෙවි කළ හැකි වීම
★ ඒකක භාරයක ආයෝජනය රු. 1 000 ගුණිතවලින් සිදු කළ යුතු වීම

(ලකුණු 1/2 × 4 = 02)

(ආ) ★ වාණිජ බැංකුවල අවසන් ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම
★ වාණිජ බැංකුවලට අවශ්‍ය උපදෙස් හා අනෙකුත් සේවා සැපයීම
★ වාණිජ බැංකුවලට ගෙවීම් හා පියවීම් පහසුකම් සැපයීම (ලකුණු 1 × 2 = 02)

04. (i) (අ) 1. රක්ෂණ කටයුතුවල නියුතු රක්ෂණ සමාගම් විවිධ ආයෝජන කටයුතුවල යෙදීම
2. විවිධ රක්ෂණ ක්‍රම හඳුන්වා දීම නිසා ව්‍යාපාරික කටයුතු පුළුල් වීම මගින් ජාතික නිෂ්පාදනය වැඩි වීම හා ආර්ථික වර්ධනය
3. සේවා නියුක්තිය වර්ධනය
4. මූල්‍ය වෙළෙඳපොල දියුණු වීම (ලකුණු 1 × 2 = 02)

(ආ) 1. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම
2. රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම
3. රක්ෂණ සමාගම් ලියාපදිංචිය අත්හිටුවීම
4. රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම
5. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම
6. රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
7. රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්දක් පැනවීම

(ලකුණු 1 × 2 = 02)

(ii) (අ) වාහනයේ රක්ෂණය වාර්ෂිකව අලුත් කරන විට ගත වූ වර්ෂයේ අලාභයක් සඳහා වන්දි ඉල්ලා නොමැති නම් වාරිකයෙන් රක්ෂණ සමාගම විසින් අඩු කරනු ලබන මුදල් ප්‍රමාණයයි.

(ලකුණු 02)

(ආ) 1. අදහස් හා පණිවුඩ හුවමාරු කරගැනීම සඳහා
2. ජාත්‍යන්තර වශයෙන් සිදුවන සිදුවීම් පිළිබඳව ක්ෂණිකව දැනගත හැකි වීම
3. අධ්‍යාපනික කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා
4. තාක්ෂණයෙන් දියුණුවත් සමඟ ඇති වන නව සොයා ගැනීම් දැනගැනීම සඳහා
5. දේශීය හා විදේශීය වශයෙන් සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීම සඳහා

(ලකුණු 1/2 × 4 = 02)

(iii) (අ) දැන්වීම් පුවරුව

1. විශේෂ සේවා කොන්දේසි දැනුම්දීම
2. විවිධ සුහසාධන වැඩසටහන් දැනුම්දීම
3. සේවකයකුගේ / අයිතිකරුවකුගේ අවමංගල්‍ය වැනි දෑ දැනුම්දීම (ලකුණු 1/2 × 1 = 1/2)

පෞද්ගලික ලිපිය

1. පත්වීම් ලිපිය ලබාදීම
2. සේවකයකුගේ සේවය අත්හිටුවීම / අවවාද කිරීම
3. සේවකයකුගේ පඩි වැඩි කිරීම, උසස්වීම් ලබාදීම (ලකුණු 1/2 × 1 = 1/2)

ඉන්ටර්කොම්

1. ඉහළ කළමනාකරුවන් පහළ කළමනාකරුවන්ට උපදෙස් ලබාදීම
2. පහළ කළමනාකරුවන් ඉහළ කළමනාකරුවන්ගෙන් උපදෙස් ලබාගැනීම
3. ආයතනයේ විවිධ අංශ අතර සම්බන්ධීකරණ කටයුතු වලදී (ලකුණු 1/2 × 1 = 1/2)

චක්‍ර ලේඛ

1. වැටුප් පටිපාටි දැන්වීම
2. සේවා මුර වෙනස්වීම් දැන්වීම
3. සේවකයින් බඳවා ගැනීම, උසස් කිරීම හා ඉවත් කිරීම සඳහා කරුණු දැක්වීම

(ලකුණු 1/2 × 1 = 1/2)

(ආ) 1. භාවිතය සඳහා තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම
2. ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇති වීම (තොරතුරුවල)
3. තාක්ෂණික ගැටලු නිසා සන්නිවේදනයේ දී බාධා ඇති වීම
4. ලිපි ගනුදෙනු කරන දෙපාර්ශවයටම අදාළ පහසුකම් තිබිය යුතු වීම (ලකුණු 1/2 × 4 = 02)

(iv) (අ) 1. සේවා නියුක්තිය වර්ධනය වීම
2. ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම
3. විදේශ වෙළෙඳාම වර්ධනය වීම
4. ජාතික නිෂ්පාදිතය වර්ධනය වීම
5. ආර්ථික වර්ධනයට සහාය වීම
6. ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. ගබඩාවේ පවතින ඉඩකඩ
2. ගබඩාවට පිවිසිය යුතු දොරවල් පිහිටීම, උස
3. ගබඩාවේ පැවතිය යුතු උස
4. ගබඩාවේ මෙහෙයුම් කාර්යයේ ස්වභාවය
5. ගබඩාවේ භාවිතා කරන උපකරණ හා ඒවායේ ප්‍රමාණය
6. ගබඩාවේ කටයුතු සඳහා යොදාගන්නා ශ්‍රමිකයින් හා ඔවුන්ගේ ස්වභාවය

(ලකුණු 1/2 × 4 = 02)

(v) (අ) කොමිස් නියෝජිතයා

ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු කරමින් ඒ මත කොමිස් මුදලක් ලබාගන්නා නියෝජිතයායි.

(ලකුණු 01)

කැපකරු නියෝජිතයා

ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදු කර එම ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් එකතු කර දීමට ද කැපවෙමින් කටයුතු කරන නියෝජිතයායි. ඔහුට සාමාන්‍ය කොමිස් මුදල්වලට අමතරව කැපකරු කොමිස් මුදල් ද හිමිවේ.

(ලකුණු 01)

(ආ) 1. යුරෝපීය වෙළෙඳපොල තුළ ශ්‍රී ලංකා වෙළෙඳපොල කොටස පුළුල් වීම
2. ඇඟළුම් සඳහා සහන හිමිවීම නිසා විදේශ වෙළෙඳපොල අභියෝගවලට සාර්ථකව මුහුණදීම
3. විදේශ විනිමය ඉපැයීම ඉහළ යාම
4. ශ්‍රී ලංකාවේ සුළු අපනයන ධාරිතාව වැඩි වීම
5. යුරෝපා පොදු වෙළෙඳපොලට කරනු ලබන අපනයන විවිධාංගීකරණයට ලක්වීම

(ලකුණු 1 × 2 = 02)

05. (i) (අ) ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ හා අරමුණු සඵලදායී ව ඉටු කරගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්ෂමතාවෙන් සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය ඇතුළත් ඵලදායී ක්‍රියාවලියකි.

(ලකුණු 02)

(ආ)

| | | | |
|---|---|---|---|
| 1. | ගතික ව්‍යාපාර පරිසරය | 2. | ආයතන / සංවිධාන |
| 3. | පරමාර්ථ හා අරමුණු | 4. | ව්‍යාපාර සම්පත් |
| 5. | සඵලදායකත්වය | 6. | කාර්යක්ෂමතාව |
| 7. | ඵලදායකත්වය | 8. | ක්‍රියාවලිය |

(ලකුණු 1/2 × 4 = 02)

(ii) (අ) ප්‍රධානියා
සමාජීය සහ නීත්‍යානුකූලව එදිනෙදා කටයුතුවල යෙදී සිටී.

නායකයා
සංවිධානමය අරමුණු ඉටු කරගැනීම සඳහා අනුගාමිකයන් අභිප්‍රේරණය කිරීමට මඟ පෙන්වීම

(ලකුණු 1 × 2 = 02)

(ආ) අග්‍ර කළමනාකරුවන් නිරතවන කාර්යයන් :-


1. සංවිධානයක පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීම.
2. උපාය මාර්ග හා ප්‍රතිපත්ති තීරණය කිරීම.
3. ආයතනයේ සමස්ත ක්‍රියාවලිය තීරණය කිරීම.
4. මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම. (ලකුණු 1/2 × 2 = 01)

මධ්‍ය කළමනාකරුවන් නිරතවන කාර්යයන් :-

1. අග්‍ර සහ පළමු පෙළ කළමනාකරුවන් අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම
2. අග්‍ර කළමනාකාරිත්වය විසින් සංවර්ධනය කරන සැලසුම්, උපක්‍රම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
3. අග්‍ර කළමනාකරණයට තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම
4. පළමු පෙළ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය හා පාලනය කිරීම

(ලකුණු 1/2 × 2 = 01)

(iii) (අ)




- සැම මට්ටමක ම කළමනාකරුවකුට ම පුද්ගලයන් හා කණ්ඩායම් සමග කටයුතු කිරීමට සිදු වන නිසා මානව කුසලතා එක සේ වැදගත් වේ.
- සංවිධානයේ සේවකයන්ගේ වැඩ කටයුතු සමග ඍජු ව ම සම්බන්ධ වන්නේ පළමු පෙළ කළමනාකරුවන් බැවින් ඔවුන්ට තාක්ෂණික කුසලතා වැඩිපුර අවශ්‍ය වේ.
- සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණ හා තීරණ ගැනීම අග්‍ර කළමනාකරුවන් විසින් සිදු කරන නිසා ඔවුන්ට සංකල්පනාත්මක කුසලතා වැඩිපුර අවශ්‍ය වේ.

(ලකුණු 02)

(ආ) 1. ඉදිරි පෝෂණ පාලනය / වැළැක්වීම
2. සහගාමී පාලනය / ක්‍රියාවලි පාලනය
3. පසුපෝෂණ පාලනය / නිවැරදි කිරීම

1. ඉදිරි පෝෂණ පාලනය / වැළැක්වීම

ආයතනයක ඉදිරියේ දී ඇති විය හැකි අහිතකර වූ ප්‍රතිඵල ඇති වීම හා එයින් අනාගතයේ කාර්ය සාධනයට ඇතිවිය හැකි හානි වළක්වා ගැනීම පිණිස ගනු ලබන පාලනය ඉදිරි පෝෂණ පාලනය වේ.

නිදසුන් :
- යන්ත්‍ර නිවැරදි ව නඩත්තු කිරීම හා ක්‍රියාත්මක කිරීමට පෙර පරීක්ෂාව
- සේවකයින් පුහුණු කිරීම මඟින් ප්‍රවීණයන් බවට පත් කිරීම
- යෙදවුම් පරීක්ෂාව

2. සහගාමී පාලනය / ක්‍රියාවලි පාලනය

ආයතනයක වැඩ කටයුතු සිදු වන අතරතුර විචලනයන් වළක්වා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග සහගාමී පාලනය වේ.

නිදසුන් :
- නිෂ්පාදන ක්‍රියාවලියේ දී සිදු වන තත්ත්ව පාලනය
- අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය
- තොග පාලනය

3. පසුපෝෂණ පාලනය / නිවැරදි කිරීම

ආයතනයක අපේක්ෂිත කාර්ය හා සත්‍ය කාර්යඵල අතර ඇති විචලන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම පසුපෝෂණ පාලනය වේ. ක්‍රියාවලි සිදුවීමෙන් පසු ඒ වන විටත් අපගමන සිදු වී ඇත් නම් එම අපගමන සොයාගත් වහා ම ඒවා නිවැරදි කෙරේ. පසුපෝෂණ පාලන ක්‍රමයේ දී පාලන ක්‍රියාවලිය ආරම්භ කරනුයේ අදාළ කාර්ය අවසාන වීමත් සමග ය.

නිදසුන් :
- කර්මාන්ත ශාලාවක යන්ත්‍රයක් අක්‍රීය වූ පසු, එය යථා තත්ත්වයට පත් කරගැනීම සඳහා කටයුතු කිරීම
- විදුලිය කාන්දුවීමක් මගින් ගිනි ගැනීමක් සිදු වූ විට විදුලි කාන්දුවට විසඳුම් සෙවීම
- මූල්‍ය අනුපාත විශ්ලේෂණය, විගණනය

නම් කිරීමට (ලකුණු 1/2 × 2 = 01)

පැහැදිලි කිරීමට (ලකුණු 1/2 × 2 = 01)

(iv) (අ) හිතකර ලක්ෂණ :-

1. මහා පරිමාණ පිරිමැසුම් නිසා ඒකක පිරිවැය අඩු වීම.
2. බොහෝ විට නිෂ්පාදන ප්‍රවාහය පාලනය කිරීමට අවශ්‍ය සේවක සංඛ්‍යාව අඩු වීම.
3. නවීන තාක්ෂණය පහසුවෙන් යොදා ගත හැකි වීම.
4. මහා පරිමාණ නිෂ්පාදනය නිසා වෙළෙඳපොල ඒකාධිකාරයක් නිර්මාණය කිරීම පහසු වීම
5. තරඟකාරිත්වයට පහසුවෙන් මුහුණදිය හැකි වීම

(ලකුණු 1/2 × 2 = 01)

අහිතකර ලක්ෂණ :-

1. විශාල ආයෝජනයක් අවශ්‍ය වීම නිසා මූල්‍ය දුෂ්කරතා මතු වීම.
2. කලින් තීරණය කරන ලද පිළිවෙළකට අනුව නිෂ්පාදනය සිදුවන බැවින් නම්‍යකරණය අපහසු වීම.
3. වෙළෙඳපොළ අවදානමකට මුහුණ දීමට සිදු වීම.

(ලකුණු 1/2 × 2 = 01)

(ආ) ස්ථාවර ස්ථානීය පිරියත

අමුද්‍රව්‍ය, ශ්‍රමය, බලය, උපකරණ ආදි යෙදවුම් නිෂ්පාදනය සිදු කරන ස්ථානයට ම ගෙනැවිත් නිෂ්පාදනය සිදු කිරීම සඳහා පිළියෙළ කරන පිරියත ස්ථාවර ස්ථානීය පිරියත වේ.

(ලකුණු 02)

(v) එකඟ නොවේ. (ලකුණු 1/2)

නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක්ම පරීක්ෂාවට ලක් කළ යුතුය.

1. අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම
2. නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම
3. අවසාන නිෂ්පාදිත පරීක්ෂා කිරීම

(ලකුණු 03 1/2)

06. (i) (අ)
1. නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය
2. යන්ත්‍රවල නම්‍යශීලී භාවිතය
3. නිෂ්පාදන ශිල්පීය ක්‍රමය
4. ගනුදෙනුකරුවන් හා සේවකයින්ට අවශ්‍ය වන ඉඩකඩ
5. ගනුදෙනුකරුවන් නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධ වීමේ තරම
6. නීතිමය තත්ත්වයක්
7. ආකර්ශණීය බව
8. අධීක්ෂණය කිරීමේ පහසුව (ලකුණු 1/2 × 4 = 02)

(ආ)
1. ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සඳහා පිරිවැය ලාභය හා නිෂ්පාදන ප්‍රමාණය පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කළ හැකි වීම.
2. නිෂ්පාදන සැලසුම්කරණයට මෙන් ම මිල නියම කිරීමේ දී ද ප්‍රයෝජනවත් වීම.
3. ව්‍යාපාර ආදායම, පිරිවැය සහ මිල යන අංශවල ඇති වන වෙනස් වීම් විග්‍රහ කළ හැකි වීම.
4. නිමැවුමේ හෝ අලෙවියේ හෝ විවිධ මට්ටම්වල දී ලාභය හෝ අලාභය හෝ පෙන්නුම් කළ හැකි වීම.
5. ආරක්ෂිත ආන්තිකය සොයා ගැනීමෙන් විකුණුම් පහත වැටීමේ අවදානම් ස්වරූපය තේරුම් ගත හැකි වීම.

(ලකුණු 1/2 × 4 = 02)

(ii) (අ) පුහුණු සේවකයන් සිටීම, අමුද්‍රව්‍යවල සුලභත්වය, යන්ත්‍ර නිසි පරිදි නඩත්තු කිරීම

(ලකුණු 1/2 × 2 = 01)

(ආ) දේශගුණය වෙනස්වීම, බෙදාහැරීමේ මාර්ගවල දුර්වලතා, රටේ පවතින දේශපාලන වාතාවරණය

(ලකුණු 1/2 × 2 = 01)

(iii) (අ) කිසියම් විකුණුම්කරුවකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කළඹ නිෂ්පාදිත මිශ්‍රය ලෙස හඳුන්වයි.

(ලකුණු 01)

හේතු :-
1. පිරිවැටුම වැඩි කරගැනීමට හා ලාභය වැඩි කරගැනීමට
2. වෙළෙඳපොල විවිධාංගීකරණය සඳහා
3. ප්‍රවර්ධන හා බෙදාහැරීමේ පිරිවැය අඩු කරගැනීමට
4. කීර්තිනාමය වැඩි කරගැනීමට
5. එක් නිෂ්පාදිතයකින් වන පාඩු අනෙක් නිෂ්පාදනයේ ලාභයෙන් ආවරණය කරගැනීමට

(ලකුණු 1/2 × 2 = 01)

(ආ) 1. සමස්ත වෙළෙඳපොළ ම විශ්ලේෂණයට භාජනය කෙරෙන නිසා වෙළෙඳපොළ පිළිබඳ ව හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.

2. උචිත හා කාලීන වෙළෙඳ පොළ අවස්ථා හඳුනාගත හැකි වීම.

3. ආයතනය සතු සීමිත සම්පත් සඵලදායි හා කාර්යක්ෂම ලෙස යොදා ගැනීමට හැකි වීම.

4. ආයතනයට වෙළෙඳ පොළ පිළිබඳ ඇති අවදානම අවම කර ගත හැකි වීම.

5. අලෙවිකරණ වැඩසටහන් වඩාත් සාර්ථක ව ක්‍රියාත්මක කළ හැකි වීම.

(ලකුණු 1/2 × 4 = 02)

(iv) නිෂ්පාදිතය - පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
මිල - පිරිවැය
ස්ථානය - පහසුව
ප්‍රවර්ධනය - සන්නිවේදනය (ලකුණු 04)

(v) ආපනශාලාව සේවා සපයන ව්‍යාපාරයක් බැවින් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් 07 ම ඇතුළත් විය යුතුය. ඒවායේ වැදගත්කම පැහැදිලි කළ තිබිය යුතුය.

(ලකුණු 04)

07. (i) (අ) භාණ්ඩයක හඳුන්වාදෙන අවස්ථාවේ සිට විකුණුම් පිරිහීමේ අදියර දක්වා පවතින අදියරයන්

(ලකුණු 02)

(ආ) යම්කිසි විකුණුම්කරුවකුගේ නිෂ්පාදිත තරගකාරී නිෂ්පාදිතවලින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි නමක්, වචනයක්, සංකේතයක්, සලකුණක්, මෝස්තරයක් නැතහොත් ඒවායේ සංයෝගයක්

(ලකුණු 1/2)

හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග :-

1. කෙටි හා සරල වීම.
2. උච්චාරණය, හඳුනාගැනීම සහ මතක තබා ගැනීම පහසු වීම.
3. නිෂ්පාදනයේ මූලික ගුණාංග, ප්‍රයෝජ්‍යතාව පිළිබඳ අදහසක් ඇඟවීම.
4. පහසුවෙන් වෙනත් භාෂාවකින් ද හැඳින්විය හැකි වීම.
5. තරගකරුවන්ගේ සන්නම්වලට වඩා වෙනස් විය යුතු වීම.
6. කිසියම් සංස්කෘතියක් නියෝජනය වීම.

(ලකුණු 1/2 × 3 = 1 1/2)

(ii) (අ) එකඟ නොවේ. (ලකුණු 1/2)

පාරිභෝගිකයාට :
1. නාස්තිය අපතේ යාම අවම වීම
2. ගෙන යාමේ පහසුව
3. තොරතුරු දැනගත හැකි වීම
4. පරිහරණය පහසු වීම

නිෂ්පාදකයාට :
1. නාස්තිය අපතේ යාම අවම වීම
2. ගබඩා කිරීම පහසු වීම
3. ගනුදෙනුකරුවන් ආකර්ෂණයට
4. ස්වයං සේවා ක්‍රමයට පහසු වීම (ලකුණු 1 1/2)

(ආ) පිරිවැය, තරඟකරුවන්ගේ මිල, ඉල්ලුම, ව්‍යාපාරයේ පරමාර්ථ, අපේක්ෂිත ලාභය, රජයේ නීතිරීති, ආදේශක භාණ්ඩවල මිල

(ලකුණු 1/2 × 4 = 02)

(iii) (අ) 1. ලාභය උපරිම කිරීම

2. කොටසක ඉපයුම උපරිම කිරීම

3. දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම

4. ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා

2. දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා (ලකුණු 1/2 × 2 = 01)

කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා - එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන අරමුදල්

නිදසුන් :- තොග මිලට ගැනීම්, වැටුප් ගෙවීම්, දුරකථන ගාස්තු ගෙවීම්

දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා - ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී මෙන්ම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී මූලික අවශ්‍ය වන්නා වූ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන අරමුදල්

නිදසුන් :- ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම (ලකුණු 1/2 × 2 = 01)

(iv) (අ) අවශ්‍ය අරමුදල් ප්‍රමාණය, අරමුදල් අවශ්‍ය වන කාලය, පිරිවැය, ව්‍යාපාර සංවිධාන ස්වභාවය, ඇප සුරකුම්, ව්‍යාපාරයේ කළමනාකරණයට සිදු වන බලපෑම (ලකුණු 1/2 × 4 = 02)

(ආ) ආයතනයේ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කරන අනුපාත

(ලකුණු 01)

ණය අනුපාතය, ණය හිමිකාරිත්ව අනුපාතය, පොළී ආවරණ අනුපාතය (ලකුණු 01)

(v) ණයකර නිකුත් කිරීම (ලකුණු 1/2)

හේතුව : 1. සමාගමේ ලාභදායිත්වය ඉහළ නිසා ණයකර නිකුත් කිරීම වාසිදායක වේ. ලාභදායිත්වය වැඩි වුවත් ණයකර සඳහා ගෙවිය යුතු පොළිය නිශ්චිත වීම

2. අවතෝලන ප්‍රාග්ධන ව්‍යුහයක් පවතින නිසා ණය ප්‍රාග්ධනය ලබාගැනීම උචිත වීමයි. එවිට ව්‍යාපාරයේ හිමිකමට සිදුවන බලපෑම අඩු වේ.

(ලකුණු 3 1/2)

08. (i) (අ) 1. සජීවී සම්පතක් වීම

2. සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකි වීම

3. සෙසු සම්පත් පාලනය කළ හැකි වීම

4. පුහුණු කිරීමෙන් අගය වැඩි වීම

5. කණ්ඩායම් වශයෙන් කටයුතු කළ හැකි වීම

6. චර්යා සංකීර්ණ වීම හා පුරෝකථනය කළ නොහැකි වීම (ලකුණු 02)

(ආ) කිසියම් නිශ්චිත පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා රැකියාවක් තැනීම හෙවත් ජනිත කිරීම රැකියා නිර්මාණය වන අතර රැකියාවක කටයුතු, රාජකාරි හා වගකීම් පිළිබඳවත්, එම රැකියාව සාර්ථක ලෙස ඉටු කිරීමට අවශ්‍ය සේවකයා සතු විය යුතු සුදුසුකම්/ගුණාංග පිළිබඳවත් කරනු ලබන ක්‍රමානුකූල විමර්ශනය රැකියා විශ්ලේෂණය වේ.

(ලකුණු 02)

(ii) (අ) 1. සේවය අවසන් කිරීම. 2. වාචික ව හා ලිඛිත ව අවවාද කිරීම.
3. පරිවාස කාලය දීර්ඝ කිරීම. 4. සේවකයා වෙනත් අංශයකට මාරු කිරීම.

(ලකුණු 1/2 × 4 = 02)

(ආ) 1. සේවක ඵලදායීතාව ඉහළ යාම.
2. සම්පත් නාස්තිය අඩු වීම.
3. සේවක ප්‍රවාසිතාව අඩු වීම.
4. සේවක පිරිවැටුම අඩු වීම.
5. අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් බිහි වීම.
6. කාර්මික ආරවුල් අඩු වීම. (ලකුණු 1/2 × 4 = 02)

(iii) (අ) පරිසරයේ හෝ සංවිධානයක සිදු වන නොයෙකුත් සිදු වීම් මගින් හා ව්‍යාපාරික ගනුදෙනු මගින් ජනිත වන මූලික කරුණු හා සංඛ්‍යා දත්ත ලෙස හැඳින්වේ. (ලකුණු 01)

තේරුම් ගත හැකි ලෙස හා ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කරන ලද දත්ත තොරතුරු ලෙස හැඳින්වේ.

| දත්ත | තොරතුරු |
|---|---|
| • දත්ත යෙදවුමකි / අමුද්‍රව්‍යකි | • තොරතුරු නිමැවුමකි / නිමිද්‍රව්‍යකි |
| • දත්ත තීරණ ගැනීම සඳහා සෘජුවම භාවිත කළ නොහැකි ය. | • තොරතුරු තීරණ ගැනීමට සෘජුවම භාවිත කළ හැකිය. |
| • දත්ත දත්ත වශයෙන් පවතින තෙක් වටිනාකමක් ගෙන නොදේ. | • තොරතුරුවලින් වටිනාකමක් ගෙනදේ. |
| • දත්ත සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දේ දත්ත වේ. | • දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහිවන ප්‍රතිදානය තොරතුරු වේ. |

(ලකුණු 1/2 × 2 = 01)

(ආ) දෘඪාංග, මෘදුකාංග, ජීවාංග, දත්ත, ක්‍රියාපටිපාටි, ස්ථිරාංග (ලකුණු 1/2 × 4 = 02)

(iv) (අ) අයදුම්පත් ඇගයීම, සම්මුඛ පරීක්ෂණ, බුද්ධි පරීක්ෂණ, පෞරුෂ පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණ, වෛද්‍ය පරීක්ෂණ, පසුබිම් පරීක්ෂණ

(ලකුණු 1/2 × 4 = 02)


(ආ) ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය ලෙස හැඳින්වේ.

විධායක සාරාංශයක වැදගත්කම :-

1. විධායක සාරාංශය සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳ ව පෙර දැක්මක් ඇති කිරීම.
2. ව්‍යාපාර සැලැස්ම පිළිබඳ ව මඟ පෙන්වීමක් ලබා දීම.
3. ව්‍යාපාර සැලැස්ම පිළිබඳ ව විශ්වාසයක් ඇති කිරීම.
4. ව්‍යාපාරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට ඇති හැකියාව. (ලකුණු 02)


(v) i බස් ජාල - Bus Network

සියලු පරිගණක පොදු පථයකට ඍජු ව සම්බන්ධ වනසේ ස්ථානගත කර ඇති ජාලය බස් ජාලය ලෙස හැඳින්වේ. පරිගණක අතර සම්බන්ධතාවේ දී පොදු පථය (Bus line) ඔස්සේ තොරතුරු ගලා යයි. ජාලයට සම්බන්ධ වන එක් පරිගණකයක් ක්‍රියා විරහිත වුවද සමස්ත පද්ධතිය අක්‍රිය නොවේ.




ii මුදු ජාල - Ring Network

සෑම පරිගණකයක් ම තවත් පරිගණක දෙකකට සම්බන්ධ වනසේ සකස් කළ ජාලයකි. මධ්‍ය පරිගණකයක් නොමැත.




iii තාරකා ජාල - Star Network

එක් මධ්‍ය පරිගණකයකට සෙසු පරිගණක සම්බන්ධ කොට සැදුම්ලත් ජාලයකි. මධ්‍ය පරිගණකය හරහා අනෙකුත් පරිගණකවලට සම්බන්ධ විය හැකි ය. මධ්‍ය පරිගණකය ක්‍රියා විරහිත වුවහොත් අනෙකුත් පරිගණක සමඟ තොරතුරු හුවමාරු කරගත නොහැකි ය.



iv ශාඛ ජාල (රුක් ජාල) - Tree Network

ගසක අතු බෙදී යන ආකාරයට මධ්‍යම පරිගණකයකට සෙසු පරිගණක සම්බන්ධ කොට සකසන ජාලයකි. මධ්‍ය පරිගණකය හෝ ආධාරක පරිගණකයක් ක්‍රියා විරහිත වුවහොත් ඉන් ඔබ්බට ඇති පරිගණකවලට තොරතුරු හුවමාරු කරගත නොහැකි වේ.



(ලකුණු 1 × 4 = 04)